පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය
10

# දෙවන වාර පරීක්ෂණය - 2023

## ලකුණු දීමේ ක්‍රියාපටිපාටිය

## ව්‍යවසායකත්ව අධ්‍යයනය I

| | | |
|---|---|---|
| 1. 4 | 11. 4 | 21. 2 |
| 2. 2 | 12. 2 | 22. 1 |
| 3. 4 | 13. 3 | 23. 2 |
| 4. 3 | 14. 4 | 24. 3 |
| 5. 4 | 15. 4 | 25. 4 |
| 6. 2 | 16. 1 | |
| 7. 4 | 17. 2 | |
| 8. 3 | 18. 1 | |
| 9. 4 | 19. 4 | |
| 10. 2 | 20. 3 | |

**(ලකුණු 2×25 = 50)**

01 I

- ඇය බෑග් මැසීමේ පාඨමාලාවක් හදාරා තිබීම
- රු 100000.00 මුදල
- මහන මැෂිම
- නිවසේ ඉඩකඩ

II

- නිර්මාණශීලීත්වය
- උනන්දුව
- කැපවීම

III

- ප්‍රසිද්ධිය
- ආත්ම තෘප්තිය
- පිළිගැනීම

IV

- අලංකාර බව
- ගුණාත්මක භාවය
- විවිධත්වය
- මනා නිමාව

V

- ජාත්‍යන්තර වෙළෙඳපොල ජය ගැනීම

**(ලකුණු 2×5 = 10)**

02. I

- ව්‍යවසායකත්ව ක්‍රියාවළියේ යෙදී සිටින්නා ව්‍යාවසායකයාය.
- නව භාණ්ඩ හා සේවා, නව ක්‍රියාවළි, නව ව්‍යාපාර උත්පාදනය කරන්නා
- නව ව්‍යාපාර අදහසක් ක්‍රියාකාරිතවයට පරිවර්තනය කිරීම පිණිස සැලසුම් කිරීම හා නිවැරදි තීරණ ඔස්සේ ආර්ථික හා සමාජයීය වෙනසක් සිදු කරන්නා.

II

- භූමිය , ශ්‍රමය, ප්‍රාග්ධනය, ව්‍යවසායකත්වය

III

- ව්‍යාපාර අවස්ථා හදුනා ගැනීමට
- ව්‍යාපාරයට ඇති තර්ජන හදුනා ගැනීමට

IV

- අධ්‍යාපනය තුළින්, අත්දැකීම් තුළින් , පුහුණු කිරීමෙන්,   විවිධ පාඨමාලා හැදෑරීමෙන්

V

- විශ්වාස හා ආකල්ප කෙරෙහි තදබල ලෙස ගැලී සිටීම
- යම් ගැටළුවකට එකම විසඳුමක් පමණක් ඇතැයි සිතීම.
- ක්ෂණික ප්‍රතිඵල අපේක්ෂා කිරීම
- තර්කානුකූල පදනම මත පිහිටා කටයුතු නොකිරීම.
- ප්‍රායෝගික වීමට බාධා ඇතැයි සිතීම
- රීති හා සම්ප්‍රදාය අනවබෝධයෙන් පිළිපැදීම
- වැරදි හා විවේචන සඳහා ඇති බිය

**(ලකුණු 2×5 = 10)**

03. I

- විවිධත්ව ග්‍රහණය කර ගැනීම
- අසාර්ථකත්ව ඉවසීම
- කුතුහලය දිරිමත් කිරීම
- ගැටළු අභියෝග ලෙස දැකීම
- නිර්මාණශීලී පුහුණු අවස්ථා
- නිර්මාණශීලීත්වය අගය කිරීම තුලින්
- නිර්මාණාත්මක හැසිරීම් ආදර්ශනය කිරීම

II

- නව භාණ්ඩ හෝ සේවා උත්පාදනය කිරීමට ඇති හැකියාව නවෝත්පාදනය නම්වේ.

III

- අනපේක්ෂිත සිදුවීම්
- ක්‍රියාවලි අවශ්‍යතා
- වෙළෙඳපොලේ වෙනස්වීම්
- ප්‍රජා පරිසරයේ හා ජන ජීවිතයේ ඇතිවන වෙනස්කම්
- දැනුම පදනම් කරගත් සංකල්ප
- සංජානනය ( තේරුම් ගන්නා ආකාරය) වෙනස්වීම

IV

| ව්‍යාපාරිකයා | ව්‍යවසායකයා |
|---|---|
| ගතානුගතික හා සම්ප්‍රදායික ක්‍රමයට ව්‍යාපාර කටයුතු වල යෙදේ. | වෙනස්වන පරිසරයට අනුගත වෙමින් නිර්මාණශීලී නවෝත්පාදන පදනම් කරගෙන ව්‍යාපාර කටයුතු මෙහෙයවයි. |
| අවධානම් භාරගැනීමට අකමැතිය | දැරිය හැකි අවධානම් භාරගනී |
| තරගයට මුහුණ දීමට කැමැත්තක් නොදක්වයි | තරගය කැමැත්තෙන්ම සොයායයි. |
| පවතින සම්පත් වලින් උපරිම ප්‍රයෝජන නොගනියි. | පවතින සම්පත් අවශ්‍යතා වලට අනුව උපරිම ලෙස ප්‍රයෝජනයට ගනියි. |
| ගතානුගතිකව ගැටළු විසඳීමට උත්සාහ කරයි. | ගැටළු නිර්මාණශීලීව විසඳයි. |

V

- නිර්මාණශීලිත්වය යනු ගැටළු හා අවස්ථා දෙස බලා ඒවාට විසඳුම් ලෙස නව අදහසක් සංවර්ධනය කිරීමට හෝ නව මාර්ග සොයා ගැනීමට ඇති හැකියාවයි. නව භාණ්ඩයක් හෝ සේවාවක් උත්පාදනය කිරීමට ඇති හැකියාව නවෝත්පාදනය නම්වේ. නවෝත්පාදනයේ ආරම්භය නිර්මාණශීලී අදහසකි. මේ අනුව නිර්මාණශීලී අදහස් ප්‍රයෝජනවත් දෙයකට පරිවර්තනය කිරීම නවෝත්පාදනය මගින් සිදුවේ.

**(ලකුණු 2×5 = 10)**

04. I

| භාණ්ඩ | සේවා |
|---|---|
| ස්පර්ශ කළ හැකිය. (භෞතික පැවැත්මක් ඇත) | ස්පර්ශ කළ නොහැකිය. |
| ගබඩා කළ හැකිය | ගබඩා කළ නොහැකිය. |
| සපයන්නාගෙන් වෙන්කල හැකිය | සපයන්නාගෙන් වෙන්කල නොහැකිය |
| නිෂ්පාදන ක්‍රියාවලියට පාරිභෝගිකයා අවශ්‍ය නොවේ. | බොහෝ විට පාරිභෝගිකයා නිෂ්පාදන ක්‍රියාවලියේ කොටසකි. |
| සමජාතීය බව ආරක්ෂා කල හැකිය | සමජාතීය බව ආරක්ෂා කළ නොහැකිය. |
| | |

II

| භූමිකාව | කාර්යයන් |
|---|---|
| අයිතිකරුගේ භූමිකාව | සම්පත් සැපයීම |
| | අවදානම් දැරීම |
| | වැදගත් තීරණ ගැනීම |
| කළමණාකරුගේ භූමිකාව | සම්පත් නිසිලෙස භාවිතා කිරීම |
| | ව්‍යාපාර සැලසුම් සකස් කිරීම |
| | සැලසුමට අනුව කටයුතු සිදු වනවා දැයි සොයා බැලීම. |
| නායකයාගේ භූමිකාව | මානව සම්පත නිසි පරිදි මෙහෙය වීම |
| | උනන්දු කරවීම |
| | බලපෑම් කිරීම |

III

- ආහාර - බත්, පාන්, බිස්කට්, කිරි
- ඇඳුම් - ගවුම්, කලිසම්, අත් ඔරලෝසු, බෑග්
- අධ්‍යාපනය - පොත්, පෑන්, පැන්සල්,ෆයිල්, A4
- ගමනාගමනය - දුම්රිය, බසය, කාර්, මෝටර් බයිසිකල්

IV

- නව භාණ්ඩ හා සේවා වෙළෙපොළට ඉදිරිපත් කිරීම
- රැකියා අවස්ථා ජනනය කිරීම
- ප්‍රාදේශීය සංවර්ධනය සිදු කිරීම
- දේශීය සම්පත් උපයෝජනය කිරීම
- රටේ සමස්ථ නිෂ්පාදනය ඉහළ යාම
- ආදායම් බෙදීයාමේ විෂමතාවය අඩුවීම
- නිමැවුම් අපනයනය තුළින් විදේශ විනිමය ඉපයිය හැකිවීම.
- ආර්ථික සංවර්ධණයට දායක වීම.
- ස්වෛරී හා නිවහල් ආර්ථිකයක් හා සමාජයක් නිර්මාණය වීම.

V

- රැකියා ලබාදීම
- නිවාඩු අහිමි වූවන්ට නිවාස තනාදීම
- පාසල් අධ්‍යාපනය ලබන දරුවන්ට ශිෂ්‍යත්ව ලබාදීම
- උපකරණ ලබාදීම
- රජයේ සුභසාධන කටයුතු වලට උදව් කිරීම
- හදිසි ස්භාවික විපත් වලදී උදව් කිරීම

**(ලකුණු 2×5 = 10)**

05. I

| ව්‍යවසායකයා | රැකියාවක් කරන්නා |
|---|---|
| ▪ ස්වාධීනව කටයුතු කල හැකිය | ▪ තවත් කෙනෙක් යටතේ සේවය කළ යුතුය.( ස්වාධීනව කටයුතු කළ නොහැක.) |
| ▪ අවදානම් භාර ගනියි | ▪ අවදානම් භාර නොගනියි |
| ▪ අරමුදල් අයෝජනය කරයි | ▪ මුදල් අයෝජනය නොකරයි |
| ▪ ලාභය/ අලාභය තනිව භුක්ති විදියි | ▪ වැටුපත් ලබයි. |

- ව්‍යාපාරයක් යනු මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීම සඳහා භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම, බෙදාහැරීම, සම්බන්ධ වූ සියලුම කටයුතුය.

II

- කුඩා පරිමාණ ව්‍යාපාර
- මධ්‍යම පරිමාණ ව්‍යාපාර
- මහා පරිමාණ ව්‍යාපාර

III

- ව්‍යාපාරයේ මුදල් කටයුතු පාලනය දුර්වල වීම
- තරගකාරිත්වයට මුහුණ දීමට අපහසුවීම
- ව්‍යාපාරික කටයුතු සැලසුම් වලින් තොරව සිදුකිරීම
- බොහෝ ව්‍යාපාරිකයින් ව්‍යවසායකයෙකු ලෙස නොසිතීම
- සම්පත් නිසිලෙස පාලනය නොකිරීම
- දුර්වල මානව සම්බන්ධතා
- ව්‍යාපාරික කටයුතු සම්බන්ධව පවතින පළපුරුද්ද ප්‍රමාණවත් නොවීම.

IV

- තාක්ෂණික කුසලතා
- මානව කුසලතා
- සංකල්පනාත්මක කුසලතා
- සන්නිවේදන කුසලතා
- ආදර්ශවත්ව කටයුතු කිරීමේ කුසලතා
- කණ්ඩායමක් සමග කටයුතු කිරීමේ කුසලතා

V

- නව තාක්ෂණික ක්‍රම හා උපකරණ භාවිතය
- පරිසර හිතකාමී නිෂ්පාදන සඳහා නැඹුරුවක් ඇතිවීම
- පාරිසරික සංචාරක කර්මාන්ත ව්‍යාප්තිය
- සෞඛ්‍යාරක්ෂිත ආහාර නිෂ්පාදනය
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ වර්ධනය
- ස්භාවික පරිසරයට ඇති කැමැත්ත වැඩිවීම
- සැලසූ ආහාර සඳහා ඉල්ලුම ඉහළ යාම
- පරිසර හිතකාමී බලශක්ති ජනනය
- නැනෝ තාක්ෂනය තුළින් ඇතිවන ව්‍යාපාර අවස්ථා

**(ලකුණු 2×5 = 10)**

6. I

- ගනුදෙනු නිවැරදිව වාර්තා කිරීම
- ව්‍යාපාරික කටයුතු සඳහා සැලසුම් සැකසීම හා ඒ අනුව ක්‍රියාත්මක වීම
- ප්‍රවීනයන්ගෙන් අවශ්‍ය උපදෙස් හා මඟපෙන්වීම් ලබාගැනීම
- බාහිර පරිසරයේ ඇතිවන වෙනස්කම් හඳුනාගැනීම හා ඒවාට ප්‍රතිචාර දැක්වීම
- ව්‍යාපාරිකයාගේ පෞද්ගලික ජීවිතය ව්‍යාපාර කටයුතු වලින් වෙන්කොට තැබීම
- යහපත් මානව සම්බන්ධතා පවත්වා ගැනීම
- වෙළෙඳපොළ පහසුකම් ණය පහසුකම්, පර්යේෂණ කටයුතු ආදී කාර්යයන් සඳහා උදව් වන රාජ්‍ය ආයතන වල සහාය ලබාගැනීම

II

- අයිතිකරුවන්
- සේවකයින්
- කළමනාකරුවන්
- සම්පත්

III

| පුරාතන පරිසරය | නූතන පරිසරය |
|---|---|
| ▪ ජනතාවගේ මූලික අවශ්‍යතා අවම මට්ටමකින් සපුරා ගනී | ▪ ජනතාවගේ මූලික අවශ්‍යතා ඉතා උසස් මට්ටමකින් සපුරා ගැනීමට උනන්දු වේ. |
| ▪ අවශ්‍යතා හා වුවමනා සරල විය | ▪ අවශ්‍යතා හා වුවමනා සංකීර්ණ වී ඇත. |
| ▪ තරඟකාරිත්වය අඩුය | ▪ තරගකාරිත්වය වැඩිවූ ඇත. |
| ▪ ව්‍යාපාරිකයින් බලවත් වූහ | ▪ පාරිභොගිකයින් බලවත් වී ඇත. |
| ▪ කුඩා ප්‍රදේශයක පමණක් සීමා වී ඇත | ▪ ගෝලීය වශයෙන් ව්‍යාප්ත වී ඇත. |

IV

- ව්‍යාපාරයක් සතු ශක්තීන් හදුනාගත හැකිවීම
- ව්‍යාපාරයේ  පවතින දුර්වලතා හදුනාගත හැකිවිම

V

- සජීවී සාධකයක් වීම
- පුහුණු කළහැකිවීම (ඉගෙනීමට ඇති දක්ෂතාවය)
- සාක්ෂරතාවය ඉහළ මට්ටක පැවැතීම.

**(ලකුණු 2×5 = 10)**